දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
E-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
Website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல. )
My No. ) CF/EXU/03/2021

ඔබේ අංකය )
உமது இல. )
Your No. )

දිනය ) 2021/10/..12
திகதி )
Date )

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதாரம அமைச்சு
**Ministry of Health**

පොදු චක්‍රලේඛ ලිපි අංක : 02-94/2021

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
රේඛීය අමාත්‍යාංශ යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
අදාළ ආයතන ප්‍රධානීන් වෙත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT-06) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයේ II "අ" ඛණ්ඩය / II ශ්‍රේණියේ සෞඛ්‍ය කිට විද්‍යා නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2021**

අතුරු වෛද්‍ය සේවයේ II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ සෞඛ්‍ය කිට විද්‍යා නිලධාරීන් සඳහා II "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට උසස් වී වසර තුනක් ගත වීමට පෙර සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. **(විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් නිකුත් කරනු ලැබේ)** විභාගය පවත්වනු ලබන දිනය, ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02 **සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය කිට විද්‍යා නිලධාරී II පන්තිය "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට උසස් කර ඇති මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන් පමණි.

**සැ.යු :- 2021/11/12 වන විට II ශ්‍රේණියට උසස් කර/අන්තර්ග්‍රහණය කර අදාළ පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.**

03 **අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරු විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශය අධ්‍යක්ෂ (විභාග) වෙත 2021/11/12 දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමඟ රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 45.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" × 4" ප්‍රමාණයේ ලියුම් කවර 03ක් ද එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

***සැ.යු. :- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.***


385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

## 04 විභාග ගාස්තු

4.1 විභාගයට පළමුවන වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

4.2 කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

## 05 විභාගයට ඇතුලත් කර ගැනීම

5.1 පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනීම සිටීමට ඉඩදෙනු නොලැබේ.

5.2 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මඟින් විධිමත් ලෙස නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

## 06 විභාග පරිපාටිය

මෙම විභාගය **දෙපාර්තමේන්තු පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** යනුවෙන් කොටස් දෙකකි.
**දෙපාර්තමේන්තු පරීක්ෂණය - ලිඛිත, වාචික** සහ **ප්‍රායෝගික** වශයෙන් කොටස් තුනකින් යුක්ත වන අතර, **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති,** යනුවෙන් සහ **මුදල් රෙගුලාසි** ලෙස විෂයන් දෙකකින් සමන්විත වේ. සෑම විෂයක් සඳහාම ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු **40**ක් ලබාගත යුතුය. එක්වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය.
**පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළ යුතුය.**

## 07 විෂය නිර්දේශය

### 7.1 දෙපාර්තමේන්තු පරීක්ෂණය

#### 7.1.1 විෂයානුබද්ධ දැනුම ප්‍රශ්න පත්‍රය (ලිඛිත) (කාලය පැය 03කි.)

මෙම ප්‍රශ්න පත්‍රය රචනා මාදිලියේ ප්‍රශ්න අටකින් (08) සමන්විත වේ. එයින් ඕනෑම ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය.

**විෂය නිර්දේශය**

01. කාලගුණය සහ රෝග කාරකයන්ගේ හැසිරීම අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධතා පිළිබඳ මූලික/මූලසාධක.
02. සියලුම රෝගකාරක ජීවීන් මර්ධනය කිරීම පිළිබඳව ශාස්ත්‍ර වර්ගීකරණය, අධ්‍යයන කටයුතු සඳහා ද්‍රව්‍ය රැස්කිරීම.
03. පිලවු සහ වැඩුන ස්වර ගොඩවල්.
04. පරීක්ෂණ සඳහා රැස්කිරීම සහ නඩත්තු කිරීම.
05. අධ්‍යාපන ප්‍රදේශ සහ අධ්‍යයන කටයුතුවලට අදාළ සිතියම් සහ සටහන් සකස් කිරීම සහ දත්ත වාර්තාගත කිරීම සහ වක්‍රගත කිරීම.
06. වර්ගීකරණය, විශේෂ හඳුනාගැනීම සහ සාපේක්ෂ බහුලතාව අධ්‍යයනය
07. විශේෂයන්ට අදාළ චර්යාත්මක ලක්ෂණ අධ්‍යයනය, ව්‍යුහ විද්‍යාව හා ජෛව කාය්‍යකාරමය
08. සමීක්ෂණ හා සමීක්ෂණයන්ට අදාළ සිතියම්කරණය
09. වාහක පාලනය හා පාලන විධි ශාස්ත්‍ර
10. සෞඛ්‍ය අධ්‍යාපනය හා සන්නිවේදනය
11. පාරිසරික සෞඛ්‍ය හා නෛතික ක්‍රියාමාර්ග


385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

**7.1.2 විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය (කාලය පරීක්ෂණයට අනුව වෙනස් වේ.)**

විෂය ක්ෂේත්‍රයට අදාළව හැකියාවන්, ක්‍රියාකාරකම් හා බැඳුනු ප්‍රායෝගික පරීක්ෂණයකි.

විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණයට අදාළ වන විෂය නිර්දේශය මෙයටද අදාළ වේ.

**7.1.3 විෂයානුබද්ධ වාචික පරීක්ෂණය (කාලය විනාඩි 15 කි.)**

විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශයට අදාළව හා සේවයේ යෙදීමේදී එළඹිය හැකි ගැටලු පිළිබඳ වාචික පරීක්ෂණයකි.

**7.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**7.2.1 ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02කි.)**

මෙම ප්‍රශ්න පත්‍රය රචනා මාදිලියේ ප්‍රශ්න හතකින් (07) සමන්විත අතර එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුයි.

**ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද**

| | | |
|---|---|---|
| XV වන පරිච්ඡේදය | - | අධ්‍යයනය, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම. |
| XVI වන පරිච්ඡේදය | - | නිවාඩු ගමන් |
| XXIII වන පරිච්ඡේදය | - | ඇතැම් වර්ග වල ලෙඩ රෝගවලින් පෙලෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහය හා ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV වන පරිච්ඡේදය | - | වැටුප් ණය සහ අත්තිකාරම් |
| XXV වන පරිච්ඡේදය | - | වෘත්තිය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහ. |
| XXVII වන පරිච්ඡේදය | - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග. |
| XXVIII වන පරිච්ඡේදය | - | පරිපාලන කාර්ය පරිපාටි සහ විධි. |
| XXX වන පරිච්ඡේදය | - | රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල. |
| XXXIII වන පරිච්ඡේදය | - | නිති උපදෙස් සහ නිති ක්‍රියාමාර්ග. |
| XLVII වන පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම සහ විනය |
| XLVIII වන පරිච්ඡේදය | - | විනය කාර්ය පරිපාටිය. |

**රාජ්‍යසේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති**

**7.2.2 මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02කි.)**

මෙම ප්‍රශ්න පත්‍රය රචනා මාදිලියේ ප්‍රශ්න හතකින් (07) සමන්විත අතර, එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුයි.

**මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද**

| | | |
|---|---|---|
| VI වන පරිච්ඡේදය | - | ආණ්ඩුවේ මුදල් යනාදියෙහි භාරකාරත්වය, අග්‍රිමය සහ බැංකු ගිණුම්, රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම්. (මු. රෙ. 315 සිට මු. රෙ. 396 දක්වා) |
| XIII වන පරිච්ඡේදය | - | සැපයීම් වැඩ සහ සේවා සැපයීම්/මිළට ගැනීමේ ක්‍රියාවලිය. ගබඩා සමීක්ෂණ ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම. (මු. රෙ. 708 සිට මු. රෙ. 775 දක්වා) |

08 **විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින් හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලාගෙන උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඩුවම් ලැබීමට යටත් වනු ඇත.

09 **කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ අදාළ නිලධාරීන්ට දැනගැනීමට සලස්වන්න.** (මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබාගත හැකිය.)

**Web Path**: - www.health.gov.lk ⟶ Staff Access ⟶ Admin ⟶ Circulars

**සැ. යු. මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවක් මතුවුවහොත් සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.**

Chamoa

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

චමික එච්. ගමගේ
නියෝජ්‍යඅධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.


385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

EXU

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

# ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT-06) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයේ II "අ" ඛණ්ඩය / II ශ්‍රේණියේ සෞඛ්‍ය කිට විද්‍යා නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2021**

01 (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................

..............................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..............................................................

..............................................................

(iv) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ)

(i) II ශ්‍රේණියට උසස් කළ / අන්තර්ග්‍රහණය කල දිනය හා ලිපි අංකය : ..............................

(ii) දැන් ලබන වාර්ෂික වැටුප : ..............................................................

(iii) ජංගම දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

(iv) ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

(v) විද්‍යුත් ලිපිනය : ..............................................................

02 ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න.

| | | | |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය සහ කාර්ය පටිපාටික රීති | [ ] | විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණය | [ ] |
| මුදල් රෙගුලාසි | [ ] | විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය | [ ] |
| | | විෂයානුබද්ධ වාචික පරීක්ෂණය | [ ] |

03 (අ) දැනට සේවය කරන ආයතනය (සිංහලෙන්) : ..............................................................

(ඉංග්‍රීසියෙන්) : ..............................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ - රේඛීය අමාත්‍යාංශයට : [ ]

පළාත් සභාවට : [ ]

(ඇ) පළාත් සභාවට නම් අදාළ පළාත : ..............................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය : ..............................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු 45.00ක මුද්දර ඇලවූ ලියුම් කවර තුනක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..............................

(ඊ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) : ..............................................................

..............................................................

(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..............................................................

..............................................................

04 විභාගයට පෙනී සිටින මාධ්‍යය (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) : ..............................................................

05 (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ........................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වතාවට නොවේනම් මුද්දර අලවා තිබේද? ........................

| මුද්දර කොටුව |
|---|
| |

---

06 අයදුම්කරුගේ සහතිකය

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(අ) මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු ..................... ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ආ) සෞඛ්‍ය අමාත්‍යංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

........................................

දිනය ........................ අයදුම්කරුගේ අත්සන

---

07 පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ / නිලධාරිණියගේ සහතිකය

මෙම අයදුම්පත භාරගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

........................................

දිනය ........................ නම සහ අත්සන

---

08 ආයතන ප්‍රධානියාගේ සහතිකය

........................................................ මහතා / මහත්මිය / මෙනවිය ....................................

නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත් අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත් / ප්‍රථම වතාවට නොවන බවත් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, රු ......... වටිනා මුද්දර අයදුම් පත්‍රයට අලවා ඇති බවත් / මුද්දර ඇලවීමට අවශ්‍ය නොවන බවත්, මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි.

........................................

දිනය ........................ ආයතන ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

---

09 විමධ්‍යගත කොට්ඨාස / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය

........................................................ මයා / මිය / මෙනවිය, II ශ්‍රේණිය සෞඛ්‍ය කිට විද්‍යා නිලධාරියකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

........................................

දිනය ........................ විමධ්‍යගත කොට්ඨාස / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

* අනවශ්‍ය කොටස් කපා හරින්න.